www.kidworship.kr

# නැවත නැගිටීම

-The Resurrection-



146Page

**හ්රර්එසදබ** යේසුස්වහන්සේ කුරුසිපත් වීමෙන් පසුව උන්වහන්සේගේ ගෝලයන් සහ අනුගාමිකයන් ගොඩක් දුකට පත් වුණා. යේසුස්වහන්සේ මැරී දින 3කින් නැවත නැගිටින බවට කී කාරණාව, ඒ අතරතුර දේවමාළිගාවේ උත්තම පූජකයන්ට මතක් වුණා. ඒ නිසා යේසුස්වහන්සේ තැන්පත් කරන ලද සො-හොන හොඳින් රැකවල් කරන්නටත්, රෑ දවල් එය මුර කරන්ටත් ඔවුන් විසින් සොල්දාදුවන්ට අණ කළා.



147Page

**පොතේ ගුරා** තුන්වන දින අළුයම, යේසුස්වහන්සේගේ ශරීරය ආලේපකරන පිණිස සුගන්ධ ද්‍රව්‍යයන්ද රැගෙන, මග්දලායේ මරියා, යකොබ්ගේ මව් මරියා, ෂලෝමි සොහොන් ගෙට යනවා. ඔවුන් යද්දී දකිනවා, සොහොන් ගෙය ඇරලා ! එය හිස්වෙලා ! යේසුස්වහන්සේගේ ශරීරය එහි නෑ ! කුමක් කරන්නදෝ යි කියා ඒ කාන්තාවන්ට හිතාගන්නවත් බැරි වුණා. ඒත් සුදු ඇඳුමින් සැරසී, එක් තරුණයෙක් (දේවදූතයෙක්) යේසුස්වහන්සේ ශරීරය තිබුණු තැනින් දර්ශනය වුණා.

**දේවදූතයා** බය වෙන්න එපා. ඔබලා සොයන්නේ කුරුසිපත් වූ යේසුස්වහන්සේ නේද? උන්වහන්සේ මෙහි නැති. උන්වහන්සේ නැගිටුන සේක.

**පොතේ ගුරා** මේ කාන්තාවන් මේ සුබ ආරංචිය බෙදාගන්න ඉක්මණින්ම යනවා. ඒත් එයාලා දුවද්දී කෙනෙක්ව මඟදී හමුවෙනවා. ඒ නැවත නැගිටි යේසුස්-වහන්සේ !! ඒ කාන්තාවන් යේසුස්වහන්සේගේ පාමුල් වැටී ආචාර කරනවා.



148Page

**යේසුස්වහන්සේ** මම ඔබලාට මුණ ගැහුණායි කියා ගිහින් අනෙක් අයටත් කියන්න. මම ඔවුන්ට පළමුවෙන් ගලීලයට යන බවත් ඔවුන්ට කියන්න.



149Page

**පොතේ ගුරා** යෙරුසලමේ නිවසක එදා රාත්‍රියේ ගෝලයන් සියලු දෙනාම රැස්වී සිටියා. රෝම සොල්දාදුවන් විසින් ඔවුන් අත්අඩංගුවට ගනීවි යන බියෙන්, ඔවුන් තදින් දොර අගුළුලා ගෙන සිටියා. ඒ වෙලාවේදී යේසුස්වහන්සේ ඔවුන් ඉදිරියේ දර්ශනය වුණා.

**යේසුස්වහන්සේ** සමාදානය වේවා!

**පොතේ ගුරා** මේ අවතාරයක්දෝයි සිතමින් ඔවුන් තිගැස්සුණා, බය වුණා. යේසුස්-වහන්සේ ඔවුන්ට කතා කරන්නට වුණා.

**යේසුස්වහන්සේ** ඔබලා කැළඹීමෙන් සිටින්නේ ඇයි ? මගේ නැවත නැගිටීම ගැන මනසේ සැකයෙන් පසුවන්නේ ඇයි ? මගේ අත් කකුල් දෙස බලන්න. මාව ස්පර්ශ කොට බලන්න.

**පොතේ ගුරා** ‍[ය්සුස්වහන්සේ මරණින් නැගිටි බව ගෝලයන් විශ්වාස කළා. උන්වහන්සේ නැවත දැකීම ගැන ඔවුන් ප්‍රීතියෙන් පිනා ගියා.



150Page

ඔවුන් සියල්ලෝම යේසුස්වහන්සේ පාමුල දණ නමා නමස්කාර කළා. මුලු ලෝකයම පව්වලින් ගළවන පිණිස දෙවියන්වහන්සේගේ පුත්‍ර යේසුතුමන් මරුණා. නුමුත් දින 3කින් මළවුන්ගෙන් නැගිට්ටා.

........................................................................................................

**පොතේ ගුරා** යේසුස්වහන්සේ ගෝලයන්ට කතා කරනවා.

**යේසුස්වහන්සේ** යන්න... මේ සුභාරංචිය හැමදෙනාටම දේශනා කරන්න. සකල ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගෙත්, ශුද්ධාත්මයාණන්ගෙත් නාමට ඔවුන් බෞතීස්මය කරන්න. මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටින්නෙමි.

**පොතේ ගුරා** එපමණක් නොව, යේසුස්වහන්සේ නැවතත් මේ ලෝකයට එන්නට යනවා. ඔව්! ලෝකය විනිශ්චය කරන පිණිස නැවත වරක් වළාකුල් පිට උන්වහන්සේ ලෝකයට වඩින බවටත් පොරොන්දු වුණා.

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, කිසිම ආගම් කතෘවරයෙක් මරණින් නැගිට්ටේ නෑ. එකම කෙනයි මළවුන්ගේ නැගිට්ටේ. ඔව්! ඒ යේසුස්වහන්සේ. උන්වහන්සේ අදත් ජීවමානයි. උන්වහන්සේට ඔයාව පේනවා. ඔයාව දැනෙනවා. ඔයාව ස්පර්ශ කරන්නත් පුළුවන්... මේ කතාව අදම ඔයාගේ යාලුවෙක් එක්ක බෙදාගන්න.